# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**මුදල් චක්‍රලේඛ ලිපි අංක : 1/2015** **2015/07/09**

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්,
ආයතන අධ්‍යක්ෂවරුන්,
මණ්ඩපාධිපතිවරුන්,

**<u>විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් සඳහා යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය</u>**

වර්තමානයේ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ආයතනික මට්ටමින් පවත්වාගෙන යනු ලබන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හැර විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් සඳහා පොදු රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ. මෙම කරුණ පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවේදී සාක්ච්ඡාවට භාජන වූ අතර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම කඩිනම් කරන ලෙසට එහිදී අවධාරණය කරන ලදී.

01) ඒ අනුව, 2015 මාර්තු 13 වන දින පැවති 912 වන විශ්වවිද්‍යාල කොමිෂන් සභාවාරයේදී විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වල සේවකයන්ගේ එකඟත්වය මත 2015 වර්ෂයේ සිට සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ස්ථාපිත කිරීම අනුමත කරන ලදී. නමුත්, විශ්වවිද්‍යාල පද්ධතියේ සිටින සේවකයන්ට මෙම සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයට දායක වීම අනිවාර්ය නොවේ.

02) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය පහත සඳහන් අංග 03 කින් සමන්විත වේ.

i) සෞඛ්‍ය රක්ෂණ ආවරණය
ii) අසාධ්‍ය රෝග ආවරණය
iii) හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණ ආවරණය

යෝජිත රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සහ කොන්දේසි සාමාජිකයන්ගේ දැනගැනීම සඳහා පහතින් දක්වා ඇත.

03) **සුදුසුකම්**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සියලු සක්‍රීය සාමාජිකයෝ මෙම යෝජිත රක්ෂණ ආවරණ ක්‍රම 01 හෝ 02 සඳහා සුදුසුකම් ලබති.

04) ප්‍රතිලාභ

| වාර්ෂික නේවාසික ප්‍රතිකාර | ආවරණ ක්‍රමය **01** | ආවරණ ක්‍රමය **02** |
|---|---|---|
| *එක් අවස්ථාවක් සඳහා උපරිමය (එක් වර්ෂයක් සඳහා උපරිමය)* | 400,000 | 200,000 |
| | | |
| *01) රෝහල් හා සාත්තු නිවාස නඩත්තු ගාස්තු* | 160,000 | 80,000 |
| *දිනකට කාමර ගාස්තුව උපරිමයකට යටත්ව* | 8,500 | 7,500 |
| *02) උපදේශක විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත ලබා දෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල් සහ ආරෝග්‍යශාලා හා සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වෛද්‍ය හා ශල්‍යකර්ම වියදම් හා ශල්‍යාගාර ගාස්තු ශල්‍යකර්ම හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු පිළිගත් වෛද්‍යවරයකුගේ නිර්දේශ මත හෝ ආරෝග්‍යශාලාවක සාත්තු නිවාස නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේ දී වෛද්‍ය උපදේශක සේවා හෝ විශේෂඥ වෛද්‍ය ගාස්තු සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර විදුලිමය ප්‍රතිකාර කායික චිකිත්සා යන මේවා ඇතුලු විශේෂඥ සේවා* | 240,000 | 120,000 |
| ***අමතර ආවරණය (පුද්ගලික රෝහල්)*** | | |
| *01) සාමාන්‍ය දරු උපතක් සඳහා උපරිමය* | 160,000 | 80,000 |
| *02) ශල්‍යකර්ම මඟින් දරු උපත් ආවරණය* | 200,000 | 150,000 |
| *03) අඬු භාවිතය (Forceps) / පීඩන (Vacuum) දරු උපත් ආවරණය* | 200,000 | 150,000 |
| | | |
| ***නේවාසික ප්‍රතිකාර (රජයේ රෝහල්)*** | | |
| *01) රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක නේවාසික ප්‍රතිකාර ලබා ඇත්නම් (දිනකට) උපරිම දින 30 දක්වා ප්‍රතිපූර්ණය කරනු ලැබේ.* | 3,500 | 2,000 |
| *02) රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබන විට පිටතින් ලබා ගන්නා බෙහෙත් පරීක්ෂණ, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා විදුලිමය ප්‍රතිකාර* | 100,000 | 75,000 |
| | | |
| ***අනෙකුත් ආවරණය*** | | |
| *01) නිවුන් දරු උපත් ආවරණය* | 25,000 | 10,000 |
| *02) ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය ආවරණය වන අතර ඒ සඳහා (Cataract) යොදාගනු ලබන කාච සඳහා* | 30,000 | 30,000 |
| | | |
| ***පුද්ගල හදිසි අනතුරු ආවරණය (UPF සේවකයාට පමණි)*** | | |
| *01) හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන මරණයකදී* | 500,000 | 500,000 |
| *02) ස්වාභාවික මරණයක දී* | 100,000 | 100,000 |
| | | |
| *බදු සහ පරිපාලන ගාස්තු රහිත වාර්ෂික වාර මුදල* | | |
| *තනි පුද්ගලයෙක් සඳහා* | 17,500 | 8,250 |
| *පවුල් ඒකකයක් සඳහා* | 20,750 | 9,650 |
| | | |
| *බදු සහ පරිපාලන ගාස්තු සහිත වාර්ෂික වාර මුදල* | | |
| *තනි පුද්ගලයෙක් සඳහා* | 20,070 | 9,462 |
| *පවුල් ඒකකයක් සඳහා* | 23,797 | 11,067 |
| | | |
| ***අසාධ්‍ය රෝග ආවරණය (සේවකයාට පමණි / අසාධ්‍ය රෝග 24)*** | | |

| | | |
|---|---|---|
| වර්ෂයක දී එක් පුද්ගලයකුට එක් අවස්ථාවකදී උපරිමය **(UPF සේවකයාට පමණි)** | 800,000 | 600,000 |
| එක් වර්ෂයක් සඳහා උපරිමය | 24,000,000 | 18,000,000 |
| එක් වර්ෂයක් සඳහා උපරිම අවස්ථා ගණන | 30 | 30 |

## 05) ලියාපදිංචි වීමේ ක්‍රමවේදය

ඇමුණුම I - i යටතේ ඇති පෝරම 01 - ඒ අනුව සුදුසුකම් ලත් සේවකයන් ලියාපදිංචි කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම්/විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන්හි ලේඛකාධිකාරිවරුන්ගෙන් ඉල්ලීමක් කෙරේ. ඇමුණුම II යටතේ ඇති පෝරම II, පිටපත් 02 ක් සහිතව සුදුසුකම් ලත් සේවකයන් විසින් පෞද්ගලිකව පුරවා ඔවුන් සේවය කරන විශ්වවිද්‍යාලය හෝ උසස් අධ්‍යාපන ආයතනය වෙත භාරදිය යුතු වේ.

## 06) වාරික ගෙවීම

ආරම්භයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාරික ගෙවීමේ විකල්ප ක්‍රමයක් දැනුම් දෙනු ලබන තෙක් සේවකයන් පෞද්ගලිකව රක්ෂණ වාරික ගෙවීම සිදුකළ යුතුය.

අදාල රක්ෂණ වාරිකය ලියාපදිංචි සේවකයන්ගේ මාසික වැටුපෙන් හෝ වෙනත් ලෙසකින් අඩුකර ඇමුණුම් I - i හි පෝරම 01 - ඒ පරිදි සාමාජිකයන්ගේ ලැයිස්තුව සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කිරීම විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරි වරුන්ගේ වගකීමක් වේ.

## 07) රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබාගැනීමේ ක්‍රමවේදය

සියලුම රක්ෂණ හිමිකම් රක්ෂණ ආවරණය සපයන්නා විසින් පහත පරිදි නිරාකරණය කරනු ලැබේ.

අ) ඍජු පදනම (කාඩ්පත් ක්‍රමය) - ඇමුණුම V හි සඳහන් ලියාපදිංචි රෝහලකට ඇතුළත් වන අවස්ථාවේදී “Health Plus” කාඩ්පත අදාල රෝහල වෙත ඉදිරිපත් කිරීම මගින්

ආ) ප්‍රතිපූරණය කිරීමේ පදනම - සියලුම වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ සඳහා වූ ඉල්ලුම් පත් අදාල විශ්වවිද්‍යාලයේ/උසස් අධ්‍යාපන ආයතනයේ, ආයතන අංශය හරහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇ) අසාධ්‍ය රෝග ආවරණය සඳහා වන බිල්පත් ප්‍රතිපූරණ පදනම මත පමණක් නිරාකරණය කරනු ලැබේ.

08) විකල්ප ප්‍රතිලාභ - සමූහ ජීවිත රක්ෂණ ආවරණය (GILAC) ඇමුණුම් VI හි දක්වා ඇති ප්‍රතිලාභ හා අනුපාතයන් පදනම් කර ගනිමින් සමූහ ජීවිත රක්ෂණ ආවරණයක් සඳහා ඉල්ලුම් කිරීමට යෝජිත රක්ෂණ ක්‍රමයේ සාමාජිකයන්ට හැකියාව ඇත.

09) **අවම සාමාජික සංඛ්‍යාව**

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියමයන්ට අනුව සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අවම වශයෙන් 10,000 සාමාජිකත්වයක් ද සමූහ ජීවිත රක්ෂණාවරණය සඳහා අවම වශයෙන් 4,000 ක සාමාජිකත්වයක්ද අවශ්‍ය වේ. ඒ අනුව මෙහි සඳහන් අවම සාමාජික සංඛ්‍යාව නොමැති අවස්ථාවකදී මෙම රක්ෂණ ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරනු නොලැබේ.

මෙම යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඊට දායක වීමට එකඟත්වය පළකල සුදුසුකම් ලත් සේවකයන්ගේ නම් ලැයිස්තුව ඇමුණුම් I පරිදි 2015 ජූලි මස 30 වන දි හෝ ඊට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් ඉල්ලීමක් කෙරේ.

මීට අදාල සියලු ආකෘති www.ugc.ac.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ වි.ප්‍ර.කො.ස.
3. උප සභාපති/වි.ප්‍ර.කො.ස.
4. කොමිෂන් සාමාජිකයන්/වි.ප්‍ර.කො.ස.
5. ලේකම්/වි.ප්‍ර.කො.ස.
6. සියළුම පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී/වි.ප්‍ර.කො.ස.
9. විශ්වවිද්‍යාලවල මූල්‍යාධිකාරීවරුන්
10. ආයතනවල/මණ්ඩපවල පුස්ථකාලාධිපති /ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර පුස්ථකාලාධිපතිවරුන්
11. ආයතනවල/මණ්ඩපවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර ලේඛකාධිකාරීවරුන්
12. ආයතනවල/මණ්ඩපවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක/ වි.ප්‍ර.කො.ස.
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. වෘත්තීය සමිති නියෝජිතයන්
18. විගණකාධිපති

පෝරමය 01 - ඒ

ඇමුණුම I - i

# විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

විශ්වවිද්‍යාලය /උසස් අධ්‍යාපන ආයතනය : ..............................................................................

සුදුසුකම් ලත් සාමාජික ලැයිස්තුව

| සාමාජිකයාගේ තොරතුරු | | | | | | යැපෙන්නන්ගේ තොරතුරු | | රක්ෂණ ආවරණ ක්‍රම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාජිකයාගේ නම | අර්ථසාධක අරමුදල් අංකය | ස්ථිර පත්වීම් දිනය | සේවා තත්වය (ස්ථිර/ තාවකාලික) | ජාතික හැඳුනුම්පත් අංකය | උපන් දිනය | යැපෙන්නන්ගේ නම | උපන් දිනය | ආවරණ ක්‍රමය 1 | ආවරණ ක්‍රමය 2 |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

.......................................................... ..............................

නි.ලේ. /ජේ.ස.ලේ. /ස.ලේ. අත්සන
(ආයතන අංශය)

ලේකම්/ලේඛකාධිකාරීගේ අත්සන

ඉහත තොරතුරු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔබ වෙත යොමු කරන ලද දෘඩ පිටපත සමඟ මෘදු පිටපත් ගණකාධිකාරී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2015 ජුලි 30 වැනි දිනට පෙර යොමු කරන්න. ( insurance@ugc.ac.lk යන විද්‍යුත් ලිපිනයට වුවද මෘදු පිටපත යොමු කළ හැක.)

# විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

විශ්වවිද්‍යාලය /උසස් අධ්‍යාපන ආයතනය : ..............................................................................................

සුදුසුකම් ලත් සාමාජිකයන් සඳහා රක්ෂණ වාරික මුදල

| සාමාජිකයාගේ තොරතුරු | | | රක්ෂණ වාරික මුදල (රු.) | | සමූහ ජීවිත රකෂණ වාරිකය (රු.) |
|---|---|---|---|---|---|
| සාමාජිකයාගේ නම | අර්ථසාධක අරමුදල් අංකය | ස්ථිර පත්වීම් දිනය | ආවරණ ක්‍රමය 1 | ආවරණ ක්‍රමය 2 | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

........................................................
නි.මූ. /ජේ.ස.මූ. /ස.මූ. අත්සන
(මූල්‍ය අංශය)

.............................
මූල්‍යාධිකාරීගේ අත්සන

ඉහත තොරතුරු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔබ වෙත යොමු කරන ලද දෘඩ පිටපත සමඟ මෘදු පිටපත් ගණකාධිකාරී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2015 ජුලි 30 වැනි දිනට පෙර යොමු කරන්න. ( insurance@ugc.ac.lk යන විද්‍යුත් ලිපිනයට වුවද මෘදු පිටපත යොමු කළ හැක.)

පෝරමය 02

රක්ෂණ ආවරණ ක්‍රමය I [ ]

II [ ]

ඇමුණුම II

| සේවක අංකය |
| --- |
| |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සාමාජිකයන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය - 2015

## අයදුම් පත්‍රය

**විශ්වවිද්‍යාලයේ/උසස් අධ්‍යාපන ආයතනයේ නම**

..............................................................................................................................

1) මුලකුරු සමඟ සාමාජිකයාගේ නම : ........................................................................................

2) තනතුර: ...............................................................................................................

3) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් අංකය: ........................................................................

4) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය ලැබූ දිනය:...........................................................

5) උපන් දිනය:.................................................................................................................

6) ජාතික හැඳුනුම්පත් අංකය:.................................................................................................

7) පුද්ගලික ලිපිනය:..........................................................................................................

8) විවාහක/ අවිවාහක බව:....................................................................................................

9) පවුල් ඒකක සඳහා වන සාමාජික තොරතුරු :

| i) කලත්‍රයාගේ නම (විවාහ වී ඇත්නම්) | උපන් දිනය | ජා.හැ. අංකය |
| --- | --- | --- |
| ................................................................. | ...................... | ................ |

ii. වයස අවුරුදු 0-21 දක්වා අවිවාහක දරුවන් ගේ විස්තර:

| දරුවන්ගේ නම් | උපන් දිනය | ජා.හැ. අංකය (වයස අවු. 18ට වැඩි) |
| --- | --- | --- |
| ................................................................. | ...................... | ................ |
| ................................................................. | ...................... | ................ |
| ................................................................. | ...................... | ................ |
| ................................................................. | ...................... | ................ |
| ................................................................. | ...................... | ................ |

10) ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවද සහතික කරමි.

11) පහත සඳහන් පරිදි සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අදාල වාර්ෂික වාරික මුදල මාගේ මාසික වැටුපෙන් අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

a) සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා වාර්ෂික වාරිකය - රු. .....................................

b) සමූහ ජීවිතාරක්ෂණ ක්‍රමය සඳහා වාර්ෂික වාරිකය - රු. .....................................

.............................................

අයදුම්කරුගේ අත්සන

*<u>සටහන :</u> මෙම අයදුම්පත්‍රය අදාල උසස් අධ්‍යාපන ආයතනයේ / උසස් අධ්‍යයන විද්‍යායතනයේ ප්‍රයෝජනය සඳහා පමණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමට අවශ්‍ය නැත.*

ඇමුණුම III

රක්ෂණ ක්‍රමයේ ඔප්පු කොන්දේසි හා නියමයන්

1. **පවුල් ඒකකය:** රක්ෂිතයා, කලත්‍රයා සහ අවුරුදු 21ට අඩු ළමුන්
2. **වයස් සීමාව :** 18 – 65 වැඩිහිටි අය සඳහා / අවුරුදු 00-21 ළමුන් සඳහා (අවසන් උපන් දිනය)
3. වෛද්‍ය ගාස්තු හා බෙහෙත් පර්යේෂණ ගාස්තු ගෙවනු ලබන්නේ වෙළඳපල වටිනාකම පදනම් කරගෙනය.
4. Endoscopy, Colonoscopy හා ඊට අදාල ක්‍රියාපටිපාටීන් සඳහා වැය වන වෛද්‍ය ගාස්තු සඳහා රු. 7500/- ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.
5. දරු උපත් සඳහා ආවරණ කාලය ඉවත් කර ඇති අතර සියළුම යැපෙන්නන් ඔප්පුව ආරම්භයේදී හෝ අළුත් කිරීමේ දී ඇතුලත් කළ යුතුය. ඔප්පු කාල සීමාව අතරතුරේදී ඇතුලත් කිරීම් කරනු නොලැබේ.
6. ගර්භණී සමය තුල සිදුවන සංකූලතා පරීක්ෂණ සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ගාස්තු ආවරණය වේ.
7. හදිසි අනතුරක් හේතුවෙන් රෝහල් ගතව සිදුකරනු ලබන දන්ත ශල්‍යකර්ම පමණක් (සම්පූර්ණ සිහිනැති කිරීමක දී /GA) ආවරණය වන අතර වැය වන වෛද්‍ය ගාස්තු සඳහා රු. 30.000/- ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.
8. රෝහල් ගත වී ප්‍රතිකාර ලබා ගත් පසුව රෝග විනිශ්චය පතෙහි වෛද්‍යවරයා නියමකළ බෙහෙත් ගැනිම සඳහා ගෙවනු ලබන්නේ සති දෙකක් සඳහා පමණි.
9. එක් වර්ෂයක් සඳහා උපරිම මුදල් සීමාව එම වර්ෂය තුල වැඩි කරනු නොලැබේ.
10. සියළුම සාමාජිකයන් සහ යැපෙන්නන්ගේ විස්තර ආරම්භක දිනයේ සිට දින 30 ඇතුලත ඉදිරිපත් කළ යුතුය.
11. හිමිකම් ලබාදීමේ දී බිල්පත් පූරණය කිරීම මඟින් පමණක් සිදුවේ.
12. නෛතික සෞඛ්‍ය පරීක්ෂණ (Routine Health Checkups) ආවරණය නොවේ.
13. පහත දැක්වෙන පරීක්ෂණ සඳහා දරනු ලබන වියදම් නේවාසික ප්‍රතිකාර සීමාව හරහා ප්‍රතිපූර්ණය කරනු ලබන අතර ඒ සඳහා රෝහල් ගතවීම අවශ්‍ය නොවේ.
    a. MRI
    b. Endoscopy
    c. Colonoscopy
    d. Bronchoscopy
    e. Sigmoidoscopy
    f. CT Scan
14. ජංගම සෞඛ්‍ය සායන මඟින් සිදුකරනු ලබන පරීක්ෂණ වාර්තා සඳහා ගෙවීම් කරනු නොලැබේ.
15. අසාධ්‍ය රෝග ආවරණ හිමිකම් ලබා දීමේදී අසාධ්‍ය රෝග 24 ක් සඳහා බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම පමණක් සිදුවේ. ශල්‍ය කර්ම සඳහා පමණි.
16. ලංකා රෝහල (Appolo) විසින් අයකරනු ලබන වෛද්‍ය ගාස්තු හා බෙහෙත් ගාස්තු මත පනවන ලද වෛද්‍ය පරිපාලන ගාස්තු ආවරණය නොවේ.
17. ආවරණය ශ්‍රී ලංකාව තුළ පමණක් ක්‍රියාත්මක වේ.
18. බාහිර උපකරණ සඳහා ගෙවීම් කරනු නොලැබේ.
19. අභ්‍යන්තර ප්‍රතිකාර සඳහා සෑම හිමිකමක්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත දින 90ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.
20. ඔප්පු කොන්දේසි හා බැහැර කිරීම් වලට යටත්වය.

ඇමුණුම IV

**අසාධ්‍ය රෝග ආවරණ ලැයිස්තුව (සාමාජිකයාට සිදුකරන ශල්‍යකර්ම සඳහා පමණි)**

1. හෘද රෝග (කිරීටක ධමනිවල රුධිර ගමන අවහිර වීම නිසා ඇතිවන රෝගී තත්වයන්)
2. කිරීටක ධමනි අවහිරතා මග හරවන ශල්‍යකර්මය
3. ආඝාත (මොළයේ රුධිර නහර අවහිර වීම හෝ පුපුරායාම නිසා ඇති කරන රෝගී තත්වයන්)
4. පිළිකා රෝග (අසාධ්‍ය රෝග ආවරණයන් 50% ක ප්‍රමාණයක් විකිරණ සහ කෙමො තෙරපි (Chemo Theraphy) ප්‍රතිකාර සඳහා ගෙවනු ලැබේ)
5. වකුගඩු අක්‍රිය වීම
6. ප්‍රධාන පෙලේ ඉන්ද්‍රිය අවයවයන් බද්ධ කිරීම සඳහා කරන ශල්‍යකර්මය. නමුත් එම ශල්‍යකර්මය සඳහා ඉන්ද්‍රියන් ප්‍රදානය කරන අයවෙත වෙත ගෙවීම සඳහා මෙම මුදල් ගෙවනු නොලැබේ
7. අංශභාගය
8. ස්නායු පටක සනවීම සහ විනාශ වීම නිසා ඇති කරන රෝගය
9. පෙනහල්ලේ අධික රුධිර පීඩනය
10. අක්මාවේ බරපතල වූ වයිරස් ආසාදන
11. හෘද කපාට ශල්‍යකර්ම
12. සංස්ථානික මහා ධමනියේ රෝගී තත්ව වලදී කරන ශල්‍යකර්ම
13. නිදන්ගත අක්මාවේ රෝග
14. පිලිස්ලීම
15. අන්ධභාවය
16. බිහිරිභාවය
17. ආබාධිත වූ මාංශ පේශි නිසා ඇතිකරන රෝගි තත්වයන්
18. ගොළුභාවය
19. නිදන්ගත පෙනහළු රෝග
20. මොළයේ ශෛල විනාශවීමෙන් ස්ථිරවම සිහිමුර්ජාවීමේ රෝගි තත්වය
21. රුධිර නාලයක ආබාධය ලිහිල් කර දැමීම සඳහා කරන ශල්‍යකර්මය
22. මොළයේ පිලිකා නොවන ගෙඩි
23. තදබල ලෙස සිහි නැතිවන තත්වයන්
24. චාලක නියුරෝන රෝගය

“Healtha Plus” කාඩ්පත් ක්‍රමය (සෘජු ගෙවීම් ක්‍රමය) සඳහා අනුමත රෝහල් ලයිස්තුව

| | ආරෝග්‍යශාලාවේ නම | දුරකතන අංකය |
|---|---|---|
| 1 | ඇපලෝ පුද්ගලික ආරෝග්‍යශාලාව කොළඹ 05 | 011-4530 000 |
| 2 | සෙන්ට්‍රල් ආරෝග්‍යශාලාව කොළඹ 10 (ආශා) | 011-4660 000 |
| 3 | ආසිරි ආරෝග්‍යශාලාව කොළඹ 05 | 011-4523 000 |
| 4 | ආසිරි ශල්‍ය රෝහල කොළඹ 05 | 011-2368 407 |
| 5 | ඩර්ඩන්ස් අරෝග්‍යශාලාව කොළඹ 03(හෘද අංශය සඳහා කාඩ්පත් වලංගු නොවේ) | 011-2575 555 |
| 6 | ජීවක අරෝග්‍යශාලාව පාදුක්ක | 011-2859 157 |
| 7 | කැන්ඩි නර්සින් හෝම් ලිමිටඩ් කැන්ඩි | 081-2222 041 |
| 8 | ලේක් සයිඩ් ආරෝග්‍යශාලාව කැන්ඩි | 081-2223 466 |
| 9 | මැ-කාති ආරෝග්‍යශාලාව කොළඹ 07 | 011-2693 953 |
| 10 | මෙඩිකල් සෙන්ටර් ලිමිටඩ් දෙහිවල | 011-2717 979 |
| 11 | වින්සෙත ආරෝග්‍යශාලාව (කලින් පැවති මෙඩිකෙයා ආරෝග්‍යශාලාව) කොළඹ 10 | 011-2667 297 |
| 12 | නවලෝක ආරෝග්‍යශාලාව කොළඹ 02 | 011-5577 111 |
| 13 | නිව් ඩෙල්මන් ආරෝග්‍යශාලාව කොළඹ 06 | 011-2586 893 |
| 14 | ඕඒසීස් ආරෝග්‍යශාලාව කොළඹ 05 | 011-5506 000 |
| 15 | පන්නිපිටිය නර්සින් හෝම් | 011-2840 384 |
| 16 | සුලෙයිමන් ආරෝග්‍යශාලාව කොළඹ 14 | 011-2422 184 |
| 17 | සුවසෙවන ආරෝග්‍යශාලාව නුවර | 081-2236 404 |
| 18 | කුටුකුරුන්ද ක්ලිනික් සහ නර්සින් | 034-2222 212 |
| 19 | ලීසන්ස් ආරෝග්‍යශාලාව රාගම | 011-2951 488 |
| 20 | ජෝසප් ෆේරේසර් ආරෝග්‍යශාලාව කොළඹ 07 | 011-2556 338 |
| 21 | නිව් පිලිප් ආරෝග්‍යශාලාව කළුතර | 034-2222 886<br>034-2222 888 |
| 22 | පානදුර නර්සින් හෝම් | 038-2236 300 |
| 23 | ශ්‍රී ජයවර්ධනපුර ආරෝග්‍යශාලාව | 011-2778 610-12 |
| 24 | නයින් වෙල්ස් කෙයාර් ආරෝග්‍යශාලා (පුද්ගලික) සමාගම | 011-4520 999 |
| 25 | කැන්ඩි පුද්ගලික ආරෝග්‍යශාලාව | 081-2234 338 |
| 26 | රොයල් ආරෝග්‍යශාලාව වැල්ලවත්ත | 011-2597 565 |
| 27 | ගෝල්ඩන් කී ඊඑන්ටී ආරෝග්‍යශාලාව | 011-2880 288 |
| 28 | සෙන්ට් ජෝසප් ආරෝග්‍යශාලාව මීගමුව | 031-2225 474 |
| 29 | ෆැමිලි කෙයාර් කළුතර | 034-2229 944 |
| 30 | ආවේ මරියා ආරෝග්‍යශාලාව මීගමුව | 031-2232 670<br>031-2222 974 |
| 31 | මොබයිල් මෙඩිකෙයා ආරෝග්‍යශාලාව නුවර | 081-2203 366<br>081-4470 366 |
| 32 | හේමාස් ආරෝග්‍යශාලාව වත්තල | 011-7888 888 |
| 33 | ආරෝග්‍යා ආරෝග්‍යශාලාව ගම්පහ | 033-2224 592 |
| 34 | සිද්ධාලේප ආයුර්වේද ආරෝග්‍යශාලාව ගල්කිස්ස | 011-2721 365 |
| 35 | විවේකා ආරෝග්‍යශාලාව වේයන්ගොඩ | 033-2295 965 |
| 36 | ගම්පහ සමූපකාර ආරෝග්‍යශාලාව ගම්පහ | 033-2222 201 |
| 37 | සෙත්මා ආරෝග්‍යශාලාව ගම්පහ | 033-2233 501 |
| 38 | මෙහොට්ටි (පුද්ගලික) ආරෝග්‍යශාලාව මාතර | 041-2222 737 |
| 39 | මාතර සමූපකාර ආරෝග්‍යශාලාව මාතර | 041-2222 084 |
| 40 | මාතර ආසිරි ආරෝග්‍යශාලා (පුද්ගලික) සමාගම | 041-4390 900<br>041-2223 180 |
| 41 | සමූපකාර ආරෝග්‍යශාලාව කුරුණෑගල | 037-2222 464 |

| | | |
|---|---|---|
| 42 | සෙත් සෙවන ආරෝග්‍යශාලාව කුරුණෑගල | 037-2232 365 |
| 43 | නාවින්න ආරෝග්‍යශාලාව - කුරුණෑගල | 037-2223 111 |
| 44 | සමූපකාර ආරෝග්‍යශාලාව ගාල්ල | 091-2224 424 |
| 45 | රුහුණු ආරෝග්‍යශාලාව කරාපිටිය ගාල්ල | 091-2234 059 |
| 46 | හේමාස් ආරෝග්‍යශාලාව දකුණ ගාල්ල | 091-2222 187 |
| 47 | මිරැකල් ආරෝග්‍යශාලාව කුරුණෑගල | 037-7390 350 |
| 48 | ඩොක්ටර් නෙවිල් ප්‍රනාන්දු ටීචින් හොස්පිට්ල් කඩුවෙල | 011-2407 608 |

බිල්පත් වෙනුවෙන් හිමිකම් ප්‍රතිපූරණය කරනු නොලබන රෝහල් ලැයිස්තුව

| | ආරෝග්‍යශාලාවේ නම |
|---|---|
| 1 | බොරැල්ල පුද්ගලික සමාගම |
| 2 | කෙළොන්නාව නර්සින් හෝම් |
| 3 | නුගේගොඩ නර්සින් හෝම් |
| 4 | හොරණ පුද්ගලික ආරෝග්‍යශාලාව |
| 5 | සුව ශාන්ති ආරෝග්‍යශාලාව අනුරාධපුර |
| 6 | නවෝද්‍යා ආරෝග්‍යශාලාව ඇඹිලිපිටිය |

පොදු බැහැර කිරීම

1. සියදිවි හානිකර ගැනීම/ගැනීමට තැත්කිරීම, මධ්‍යසාර භාවිතය, සමාජ රෝග, මන්ද බුද්ධික තත්වයන්/ උමතුව හේතුවෙන් රෝහල් ගතවීමට සිදුවුවහොත් දැරීමට සිදුවන වියදම්.

2. රක්ෂණාවරණය ලබාගැනීමට පෙර සිට රක්ෂිතයා යම් ශාරීරික දුබලතාවයකින් පෙලෙන විටදී රක්ෂණාවරණය ලබාගන්නා අවස්ථාවේදී එය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට දැනුම් නොදුන් විට එම රෝග.

3. කැරළි කෝලහාල සහ වැඩ වර්ජන සඳහා දායක වීමෙන්

4. වෛද්‍යමය සේවාවන් නොවන වියදම් (ටෙලිවිෂන්, දුරකථන ගාස්තු, ටෙලෙක්ස් ගාස්තු, අතිරේක ආහාර සඳහා ගාස්තු සඳහා වන වියදම්, රේඩියෝ වැනි සේවා සඳහා රෝහලෙන් අයකරනු ලබන වියදම්)

5. උපතේ සිට පවතින අසනීප තත්වයන් හේතුවෙන් රෝහල් ගතවීම සිදුවුවහොත් දැරීමට සිදුවන වියදම්

6. ප්ලාස්ටික් ශෛල්‍යකර්ම හෝ ඒ සඳහා වන වියදම් (හදිසි අනතුරකදී හැර)

7. උපත් පාලන ක්‍රම සඳහා වන වියදම් හා මදසරු බව හා නිසරු බව සඳහා වියදම්

8. ලේසර් ප්‍රතිකර්ම සඳහා වන වියදම් ((lasic and Laser Treatments)

ඉහත සඳහන් වියදම් සඳහා මෙම රක්ෂණ ආවරණ ක්‍රමය පහසුකම් සලසන්නේ නැත.

සමූහ ජීවිත රක්ෂණය සඳහා අදාල පිරිවැය සහ ප්‍රතිලාභ (ණය සුරැකුම් ආවරණය)

| වයස් සීමාව | එක් පුද්ගලයකු සඳහා වාර්ෂික වාරිකය (රු.) | | | |
|---|---|---|---|---|
| | විකල්ප I | විකල්ප II | විකල්ප III | විකල්ප IV |
| 18 – 30 | 1,915 | 3,825 | 5,740 | 7,650 |
| 31 – 35 | 1,930 | 3,870 | 5,810 | 7,745 |
| 36 – 40 | 2,125 | 4,245 | 6,370 | 8,490 |
| 41 – 45 | 2,390 | 4,785 | 7,180 | 9,570 |
| 46 – 50 | 2,960 | 5,920 | 8,875 | 11,835 |
| 51 - 55 | 4,020 | 8,040 | 12,060 | 16,085 |
| 56 – 60 | 6,050 | 12,110 | 18,165 | 24,220 |
| 61 – 65 | 9,650 | 19,295 | 28,940 | 38,590 |

| ප්‍රතිලාභ | රක්ෂිත මුදල | | | |
|---|---|---|---|---|
| | විකල්පය I | විකල්ප II | විකල්ප III | විකල්ප IV |
| ජීවිත රක්ෂණාවරණය | 500,000 | 1,000,000 | 1,500,000 | 2,000,000 |
| හදිසි අනතුරක් හේතුකොටගෙන මරණයට පත්වීම | 500,000 | 1,000,000 | 1,500,000 | 2,000,000 |
| හදිසි අනතුරක් හේතුකොටගෙන ඇතිවන පූර්ණ අකර්මණ්‍යතාවය | 500,000 | 1,000,000 | 1,500,000 | 2,000,000 |
| රෝගාබාධයක් හේතුකොටගෙන ඇතිවන පූර්ණ අකර්මණ්‍යතාවය | 500,000 | 1,000,000 | 1,500,000 | 2,000,000 |
| හදිසි අනතුරක් හේතුකොටගෙන ඇතිවන අර්ධ අකර්මණ්‍යතාවය | 500,000 | 1,000,000 | 1,500,000 | 2,000,000 |

සටහන : ඉහත සඳහන් සිදුවීම් අතුරින් එක් සිද්ධියක් හෝ හටගත හොත් රක්ෂිත මුදල සාමාජිකයාට/ නාමිකයකුට ගෙවනු ලැබේ.